

Photo : Lyndon Foo

හිම බිමේ සුදු රෝස

3

විද්‍යානි මනතුංග

ලියන නවකතාව

මෙතෙක් කතාව

පර්ත් පැමිනෙත්දී පීටර් අන්කල් වෙනුවෙන් රැගෙන එන පාර්සලය කෝච්චියේ අමතක කරනා ලහිරු, අතීත ආවර්ජනයන් හා වර්තමාන සිදුවීම් අතර පැටලෙමින් තමා පැමිණ ඇති ගමනට පැහැදිලි අරමුණක් සොයයි...

අද එතැන් සිට

මට කතා කිරීමට කිසිසේත් ම අවශ්‍ය නොවන ප්‍රශ්නයකට පිළිතුරු තාත්තා මගෙන් බලාපොරොත්තු වූයේ එවැනි එක් දිනයක ය.

''මන් දන්නෙ නෑ තාත්තා....''
ඇත්තටම ඊට පිළිතුරු මා දැන සිටියේ නැත.

''ලහිරු... අම්මට හුරතල් වෙවී හිතුවක්කාර උනා දැන් හොඳටම ඇති''

''පුතාට ටිකක් නිදහසේ ඉන්න දෙන්න ඊවඩ්... එයා හිතල බලල තීරණයක් ගනියි... පොඩි ළමයෙක් නෙමෙයිනෙ''

''පොඩි ළමයෙක් නොවන නිසා තමයි දැන් මේව ගැන කතා කරන්න ඕනෙ.. කොළඹ ඉන්නකම් රස්තියාදු ගගහ කොල්ලොත් එක්ක පාටි දදා පිස්සු කෙලිය.... යන්තම් මේකවත් කරගනියි කියල මම හිතුවෙ නැහැ කරන් එනකම්.... කොහෙ ද යන්නෙ ලහිරු... ඔහොම ඉන්නව ටිකක්..... මම කතාකරල ඉවර නැහැ''

මම නැවතුනෙමි. එහෙත් මෙතන නොඉන්න ඇත්නම් වඩා හොඳ ය.

''ටිකක් ඉවසල කතා කරන්න ඊවඩ්..... පුතා යන්න දැන්.... පස්සෙ තාත්ත කතා කරයි''

හැමදාම මේ පටලැවිල්ලෙන් මා ගලවන්නේ අම්මා ය. මම යාබද කාමරයේ තිබූ සෝපාවේ හාන්සි වුනෙමි. තාත්තාගේ කතාවේ ඉතිරි ටික, එතන නොසිටිය ද මා අසාගත යුතු ය. මටවත් තේරුම්ගත නොහැකි මගේ මේ මානසික විපර්යාසය සමහරවිට ඔහු හොඳින් තේරුම්ගෙන තිබෙනවා වන්නට පුළුවන.

''අනික... ඔයා දැන් ලහිරු ව බබා කරගෙන හිටිය කාලෙ ඉවරයි තේරුණා ද''

අම්මා තදින් සිනාසෙනවා මට ඇසිණි.

''මොකද හිනාවෙන්නෙ?'' ඒ තාත්තා ය. ඔහුගේ කටහඬේ කලින් තිබූ දැඩි ගතිය දැන් නොමැත. අම්මා සිනහව නවතා ඔහුට පිළිතුරු දේ.

''තේරුනා... ලහිරු දැන් තැන්පත් වෙලා. ඒ කියන්නේ වැඩිහිටියෙක් වෙලා. මම නම් ඒකට කැමතියි.''
''ඒක තමයි මට වැඩියෙන් බය''
තාත්තා හරිය. මා ද බියවන්නේ එබැවිනි.

''මොකක්ද ඒකෙ බයවෙන්න තියෙන්නෙ....?''

තාත්තා කුමක් කියනු ඇත් ද? ප්‍රශ්න කරනු ලැබුවේ අම්මා වුවද පිළිතුරක් බලාපොරොත්තුව සිටින්නේ මා ය. නමුත් ඔහු ඊට කිසිවක් කියනවා මට නෑසිණි. සමහර විට මා ඔහුට ඇහුම්කම් දෙමින් සිටින බව ඔහු දන්නා බැවින් එසේ කරන්නට ඇත.

සුසුමක් හෙලා ලය සැහැල්ලු කරගත් මම කාමරය සිසාරා නෙත් හෙලුවෙමි. කාමරයේ පසෙකින් වූ ලියන මේසය මත අම්මාගේ විශාල ඡායාරූපයක් තබා තිබිණි. එය ඈ තරුණ වියේදී ගත්තක් විය හැකි ය. නමුත් එදත් අදත් ඈ තුළ කිසිම වෙනසක් මම නොදකිමි. කොණ්ඩය කොටට කපා කෙටි ගවුමකින් සැරසී ඈ එහි සිටියේ මද සිනහවකින් යුක්තව ය. අම්මාගේ ඒ සිනහව මට මතක් කරදුන්නේ වෙන කෙනෙකුගේ මුහුණකි. ඒ ටාන්‍යා ය. ඇගේ පෙනුමේ අම්මාගේ පෙනුමේ තරම් පිළිවලක් මා නුදුටුවද ඇගේ සිනහව තුළත් මෙතරම් ම සුන්දරත්වයක් තිබෙන බව මම පිළිගනිමි.

''පුදුම වෙන්න එපා.....
මගේ තාත්ත හමුදාවෙ
හිටපු කෙනෙක්. ඒ
දවස්වල තාත්ත
හොංකොංවල වැඩකලා...
මම හුඟක් පුංචියි අපි
ලංකාවට යනකොට....''

මුල් ම දිනවල කොළඹ දී මට මුණ ගැසුණු දන්නා හඳුනන යුවතියන් සියල්ලන්මත් මට වරින් වර සිහිපත්කර දුන්නේ ටාන්‍යා ය. කිටිකිටියේ ඇඟට තදවනසේ හැඳ සිටි කලිසම, එල්ලෙන කරාබු, මුහුණ පුරා තවරාගෙන සිටි වත්සුනු ගොන්න, ඒ කාලයේ මා මේ සියල්ල දෙස බැලුවේ සතුටිනි; ආසාවකිනි. ප්‍රිය සාදයක දී ඔවුන් නොමැතිව පාලුවක් දැනෙන තරමට ම මම ඔවුන්ගේ ඇසුර ප්‍රිය කළෙමි. කකා බිබී සිංදු කියමින් එක ගොන්නට වැටී නටමින් ගතකල යුගය දෙස මා ආපසු හැරී බලන්නේ හැඟීමකින් තොරව ය.

මා තුළ කලින් තිබූ මේ සිතිවිලි නිසා ම මම පර්ත් සිටියදී ටාන්‍යා ගේ ඇසුරට අකමැති වුනෙමි. ඇය තුළ යුවතියක් කෙරෙහි පිහිටන කිසිදු ලස්සනක් දකින්නට නැත යැයි මම විශ්වාස කළෙමි. එහෙත් දැන් ඒ විශ්වාසයේ යම් වරදක් ඇත යැයි මට මව්බිමේ දී මුණ ගැසුනු සියලු දන්නා හඳුනන තරුණියෝ වරින් වර පෙන්වා දෙනු ලැබුවා මට මතකය. මගේ විශ්වාසයේ හරිය හෝ වැරැද්ද පිළිබඳව මම කණගාටු නොවෙමි. මට ප්‍රශ්නයක් වී ඇත්තේ හෙටය යන දිනය තුළ මා ග්‍රහණය කිරීමට තැත් කරන සියලු අරමුණු වසා මේ සුදු යුවතියගේ මතකය පැතිර පැවතීමයි.

බසය අධිවේගී මාර්ගයෙන් ඉවත්වී ඇත. එහි ධාවන වේගය වෙනස් උනේ එබැවිනි. මොහොතකින් මා මෙයින් ඉවත් විය යුතු ය. එහෙත් මා මුණගැසීමට යන්නේ කාව ද?

බසයෙන් බැසගත් මම මට සුපුරුදු මාර්ගයේ පුස්තකාලය දෙසට පා තැබුවෙමි. අද සිකුරාදා බැවින් එතරම් සිසුන් ප්‍රමාණයක් අවට ගැවසෙනවා මම නොදිටිමි. මේ මාර්ගයේ දී කීවතාවක් මට ටාන්‍යා මුණගැසී ඇත් ද? පුස්තකාලයට යන අදහස හදිසියේ වෙනස් කරගත් මම කොර්ඩෝවෙන් මෑත් වී තණ බිස්ස හරහා ගොස් පඳුරු ගොන්නක් අයිනේ වූ බංකුවක වාඩි උනෙමි. පදුරු ගොන්නෙන් ඈත් වී කුඩා හා පැටවුන් දෙදෙනෙක් මා සිටින දෙසට පැමිණියේ තරඟයට මෙනි. උන් දෙදෙනා මා අසලටම පැමිණියේ මා නිසොල්මනේ උන්ට ඉඩදී සිටි බැවිනි. මෙවැනි නිශ්චල සිතක් ඇති කරගෙන සිටින්නේ මේ මාම ද යැයි මට සැක සිතේ........

ටාන්‍යා දිනක් මා ඇගේ ගෙදරට කැඳවාගෙන ගියා මට මතක ය. මා තුළ ඈ කෙරෙහිවූ අප්‍රසාද ප්‍රතිරූපය මදක් වෙනස් කරන්නට ඒ ගමන ඉවහල් වූවා යැයි මට සිතේ. ඈ ඊට ඉඩ සලසාගත්තේ ද අහම්බෙනි.

''ලහිරු.... ඔයා මුහුදට හුඟක් ආසයි නේ ද?''

දිනක් දුම්රියේදි ඈ විමසුවේ මා ඒ දෙස ම නෙත් හෙලා සිටිනවා ඈ දැක ඇති බැවින් විය යුතුය.

''ඔව්.... මම කැමතියි'' මම සාමාන්‍ය හැඟීමෙන් යුතුව පැවසුවෙමි.
''මමත් හරි කැමතියි''

ඊට පිළිතුරු ලෙස මම සිනාසුනෙමි. ඈ පොතකට ඔබාගත් මුහුණින් යුතුව සිටිනවා මිස කිසි දවසක දුම්රිය කවුළුවෙන් පිටත බලනවා මා දැක නොතිබිණි.

''මට විශ්වාස කරන්න අමාරුයි''මා කීවේ සමච්චලයට මෙනි.

ඊට පිළිතුරු වශයෙන් කිසිවක් ම නොකියා සිනාසුනු ඇය පසුවදා දවල් කැන්ටිමේදී මාත් මහේලත් සිටි මේසය වෙත පැමිණියේ ආරාධනාවක් ද සමගිනි. ඒ ද අද මෙන් ම සිකුරාදා දිනයකි.

''ලහිරු.... හෙට මගේ අක්කල දවල්ට අපේ ගෙදර එනව කෑමට. ඔයාට හෙට දවල් නිදහස් නම්... කැමති ද දවල් කෑමට අපේ ගෙදර එන්න.''

ඈ එදා එක එල්ලේ මා දෙස බලමින් ආරාධනාව යොමු කළේ මා වෙතය. එහෙත් මා කිසිවක් සිතා ගැනීමටත් කලින් ඊට පිළිතුරු දුන්නේ මහේල ය.

''ස්ථිරවම අපි දෙන්න එනව... මගේ කාරෙකේ එන්න පුළුවන්. මට දෙන්නකො ඔයාගෙ ලිපිනය''

මා තුළ නැඟී ආවේ තරහකි. ඒ ටාන්‍යා පිළිබඳව ද මහේල පිළිබඳවදැයි පැහැදිළිතාවයක් නොවුන ද මා එය පිට කළේ ටාන්‍යා වෙතට ය.

'' මට නම්, එන්න බැරිවෙයි සමහරවිට..... මට වෙන වැඩක් තියනව හෙට''
''කමක් නැහැ එහෙනම් අපි වෙන දවසක මුණගැහෙමු.....''

එසේ කියමින් නැඟී සිටි ටාන්‍යාගේ මුහුණේ මා කිසිම හැඟීමක් නොදුටුව ද මා තුළ වූ තරහ පසුතැවිල්ලකට පෙරලීමට ඒ ප්‍රතිචාරය ප්‍රමාණවත් විය.

''ටාන්‍යා... ඉන්න මට ඒ වැඩේ වෙන දවසක කරගන්න පුළුවන්..... කීයට ද එන්න ඕනෙ..''

''පර්ත් වලින් උදේ දහයමාරට කුරුම්බයින් කෝච්චිය අරගෙන විත්ප්‍රඩ් නැවතුමෙන් බහින්න. මම එතනට එනව එක්කගෙන යන්න'' ඈ එය කියාගෙන ගියේ කටපාඩම් කරගෙන සිටියාක් මෙනි.

මා පුදුමයට පත්කරමින් පසුවදා මහේලත් මාත් කැඳවාගෙන යාමට ටාන්‍යා පැමිණ සිටියේ අති සුඛෝපභෝගී වාහනයක ය. එහෙත් රියදුරු අසුනේ වූයේ කිසිදු විශේෂත්වයකට හිමිකම් නොකියන සුදෝ සුදු දුහුල් කපු ගවුමකින් සැරසුනු නිකම්ම නිකම් සුදු යුවතියකි. කොණ්ඩය සුපුරුදු පරිදි කිසිදු සැලකිල්ලකින් තොරව ඈ මුදාහරිනු ලැබ සිටියා ය. දෙපයේ වූයේ සරල හම් පාවහන් යුවලකි. මා සිත සිතා සිටියේ මොන අම්බලමකට අප කැඳවාගෙන යනවා ඇත් ද කියා ය.

මහේලටත් ටාන්‍යාටත් ඇති තරම් කතාබහ කිරීමට ඉඩ හල මම වීදුරුවෙන් පිටත බලා සිටියෙමි. ඒ දසුන මා කවදත් ප්‍රියකරන්නකි. මෙහි තිබූ විශේෂතාවය නම් මුහුදු වෙරළ දිගට ම ජනාකීර්ණ වී තිබීමයි. මා කෙරෙහි වූ සැලකිල්ල නිසා ම ඈ වෙරළ මායිමේ දිවෙන මාර්ගය වාහනය පැදවීම සඳහා තෝරා ගෙන ඇති බවක් මම සිතුවෙමි. වැඩිදුරක් එසේ යාමට නොලැබිණි. හිටිහැටියේ ඈ වාහනය නැවැත්වූයේ මගේ දර්ශන පථය හදිසියේ ම වෙනස් කරමිනි. ඉදිරිපස වීදුරුව තුළින් මා දුටු දර්ශනය මා පුදුමයට පත් කරලීය. මහේල ද මා මෙන්ම පුදුමයට පත් වී ඇතුවා සේය.

''මචං... අපි, හිතුවට වඩා පෝසත් කෙල්ලෙක් ටාන්‍යා''

තට්ටු දෙකේ දෙමහල් නිවසක් වූ ඇගේ නිවස කෙලින් ම මුහුණ ලා සිටියේ මුහුදු වෙරළට බව පිළිගැනීමට මට ආපසු හැරී බැලීමට අවශ්‍ය නොවන්නේ ය. දොරටුව අසල දී ඇගේ මවත් පියාත් අප පිළිගත්තේ ඉතාම සුහද ලීලවකිනි. මා වඩාත් ම පුදුමයට පත් කළේ ටාන්‍යාගේ මවත් වැඩිමහල් සොහොයුරියත් ඉතා පිළිවෙලට හැඳ පැළඳගෙන සිටීම ය. ඒ සිත් ඇදගන්නා සුළු පෙනුම විස්තර කල යුත්තේ 'පිළිවෙල'' ලෙසට දැයි කීමට මම නොදනිමි. නමුත් ඔවුන් දෙදෙනා ම මිල ගණන් ඉහළ යැයි සිතිය හැකි ඇඳුම් හැඳ